## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත පහත සදහන් තනතුරු සදහා අදාල සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**බිල්පත් සහායක සහ හෙද සහයක**

**(පැයට ගෙවීමේ පදනම මත)**

## 1. බිල්පත් සහායක

**සුදුසුකම්:**

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම අමතර සුදුසුකමක් වේ.

**අමතර සුදුසුකම්:**

I. වාචික සහ ලිඛිත, ඉංග්‍රීසි සහ සිංහල යන භාෂා ද්විත්ත්වයෙන්ම විශිෂ්ඨ සන්නිවේදන කුසලතා තිබීම.
II. උසස් අයුරින් අයතනික සහ දුරකථන ආචාර විධි පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වීම.
III. යහපත් අන්තර් පුද්ගල සබඳතා සහ කුසලතා සහිත අයෙකු වීම.
IV. පරිගණක සාක්ෂරතාවය ඉහළ අගයක පැවතීම.
V. සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩල සමග සහයෝගයෙන් වැඩ කිරීමට ඇති හැකියාව.
VI. විශිෂ්ඨ ගණිත හැකියාවකින් යුක්ත වීම.
VII. අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

පැයකට රු.**250.00** ක් වශයෙන් ගෙවනු ලැබේ.

## 2. හෙද සහායක

**<u>සුදුසුකම්</u>**

I. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යන විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන වෘත්තීය සුදුසුකම් කාණ්ඩ අංක 03 හෝ 04 (NVQ 03 or 04 ) හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVEC) ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ඇ. ශ්‍රී ලංකා පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව යටතේ ලියාපදිංචි වී ඇති හෙද පුහුණු ආයතනයකින් හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සහ

III. අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අමතර සුදුසුකම්</u>**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් කුමන හෝ විෂයයන් තුනක් එකවර සමත් වීම.

II. ඖෂධ අලෙවිසැලක සේවය කිරීම සහ විද්‍යුත් බිල්පත් සැකසීම පිළිබඳව අවම වශයෙන් වසර **02** ක පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

III. තොරතුරු තාක්ෂණය හා පරිගණක දැනුම පිළිබඳව ඇති හැකියාව.

**වයස් සීමාව:**

අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු **35** ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

පැයකට රු.250.00/- ක් වශයෙන් ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2024.09.02** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

3. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**